පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ශිල්ප කලා

සතිය- 08

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පාඩම:- මැටි භාණ්ඩ විවිධ මාධ්‍ය භාවිතයෙන් අලංකාර කරයි.**

11 ශ්‍රේණියේ පෙළ පොතේ පිටු අංක 145-152 දක්වා හොඳින් අධ්‍යයනයෙහි නිරතවීමෙන් පසු පහත සඳහන් අභ්‍යාසවල නිරතවන්න.

- පිලිස්සු මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා සායම් වලට අමතරව වෙනත් විවිධ මාධ්‍ය භාවිතයට ගනු ලැබේ.

1. පහත සඳහන් කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.
   I. මැටි භාණ්ඩ පෙර පිරියම් කිරීම.
   II. මැටි භාණ්ඩ පසු පිරියම් කිරීම.

2. මැටි භාණ්ඩ අලංකාර කිරීමට පාන් මිශ්‍රණ හා කෝන් පිටි මිශ්‍රණ යොදා ගනී.ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| අලංකරණයට යොදා ගත් මිශ්‍රණයේ නම | මිශ්‍රණය සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය | සකස් කළ මිශ්‍රණ භාවිතා කර භාණ්ඩ අලංකාර කිරීම පියවර ලෙස ලියන්න. |
|---|---|---|
| | | |
| | | |

3. හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර ලියන්න.
   වර්ණවත් කඩදාසි ඉරා අලවා ගැනීම ___________ක්‍රමය ලෙස හඳුන්වයි.කඩදාසියකින් ___________යන අර්ථය ප්‍රංශ භාෂාවේ ___________ලෙස හඳුන්වන අතර මෙම ක්‍රමය මගින් භාණ්ඩ අලංකාර කිරීමේදී කපා වෙන් කරගත් ___________භාවිතයට ගනී.
4. කඩදාසි ආශ්‍රිතව මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම නම් කරන්න.
5. ඉහතින් දැක්වූ අලංකරණ ක්‍රම භාවිත කරමින් භාණ්ඩ අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න.
6. 
   I. පල්ප් ක්‍රමයට මැටි භාණ්ඩ අලංකාර කිරීමේදී පල්ප් සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
   II. පල්ප් භාවිතා කර මැටි භාණ්ඩයක් අලංකාර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
7. වැලි වක් කිරීමේ ක්‍රමයට මැටි භාණ්ඩ අලංකාර කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය නම් කර ,එම ක්‍රමය භාවිත කරමින් භාණ්ඩයක් අලංකාර කර ගන්නා ආකාරය පියවර ලෙස ලියන්න.
8. විවිධ මාධ්‍ය භාවිත කරමින් මැටි භාණ්ඩ කිහිපයක් උසස් නිමාවකින් අලංකාර කිරීමේ ක්‍රියාවලියේ නිරතවන්න.ඔබගේ නිර්මාණ ගුරුවරයාගේ නිරීක්ෂණය සඳහා යොමු කරන්න.